**බුත්තල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මහගොඩයාය කොම්පෝස්ට් අංගනය කොන්ක්‍රීට් කිරීමට සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.812,105ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ආ) උතුර නැගෙනහිර පළාත්පාලන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ බුත්තල මහජන පුස්තකාලයට සමාලෝචිත වර්ෂයේදී ලැබුණු එකතුව රු.4,160,975ක් වූ පරිගණක හා කාර්යාල උපකරණ ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ලැබුණු රු.72,000ක සම්ප්‍රේෂණ කුළුණු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.141,000ක සම්ප්‍රේෂණ කුළුණු ආදායම ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.410,900ක ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.171,620ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ වියදම් එම වටිනාකමින් අඩුවෙන් හා අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) 1988 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින දේපළ 6කට අදාල රු.1,235,279ක හිඟ බදු කුලී සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි.

(ii) 2010 -2016 කාල පරිච්ඡේදය තුලදී සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් අයවිය යුතු රු.2,770,542ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(iii) 2008 හා 2011 වර්ෂවලදී කඩා ඉවත්කරන ලද සභාවට අයත් කඩකාමරවලින් එකතුව රු.196,054ක හිඟ කඩකාමර කුලී සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදලින් 2011 සහ 2012 වර්ෂවලදී ලබාගෙන තිබුණු එකතුව රු.25,563,562ක් වූ ණය මුදලට අදාලව ගෙවිය යුතු එකතු ණය වාරික හා පොලී රු.3,205,224ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් ගෙවා නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.438,989,914ක් වූ ගිණුම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය | 141,000 | සභා බලප්‍රදේශයේ විවිධ සමාගම් විසින් ඉදිකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 03කින් ලැබිය යුතු වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| | (i) රීති අංක 67 | - | සභා බලප්‍රදේශය තුල පිහිටි වෙළඳ ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඒවා ලැයිස්තුගතකර නොතිබුණි. |
| | (ii) රීති අංක 193 | - | එක් එක් ආදායම් හා වියදම් විෂයයන් යටතේ වන අතිරික්තයන්/ ඌණතාවයන් හා ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයන් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 248,353 | 2010 - 2015 කාල පරිච්ඡේදය තුළදී ඉටුකරන ලද කර්මාන්ත 06කට අදාල නිදහස් නොකල අතුරුදුවුම් මුදල් රජයේ ආදායමට ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභාව සතු වාහන 21ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති 1597/8 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වැනි උපලේඛනය | - | පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු හා ආවරණ අනුමැතියදීම පිළිබඳව ගාස්තු අයකිරීම සඳහා ප්‍රසිද්ධකර නොතිබුණි. |
| (ඊ) | ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ 2013 ජුනි 28 දිනැති 1816/43 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රය | - | සභාව විසින් අනවසර වෙළෙඳසැල් හා ජංගම වෙළඳාම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා එම කාර්යය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, විධිමත් කිරීම හා තහනම් කිරීමට අවශ්‍ය කටයුතුකර නොතිබුණි. |
| (උ) | ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | - | 2006 වර්ෂයෙන් පසුව සභාව සතු කඩකාමර කුලී තක්සේරු කිරීමට කටයුතුකර නොතිබුණි. |

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,022,021ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,466,116ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 2,283,220 | 2,187,505 | 1,476,668 | 2,601,219 | 2,257,070 | 2,262,302 | 1,382,368 | 2,944,404 |
| (ii) | කුලී | 5,860,800 | 5,709,700 | 4,660,975 | 2,291,490 | 5,394,100 | 5,611,376 | 5,475,793 | 1,994,573 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,174,000 | 1,174,559 | 1,174,459 | - | 1,246,500 | 1,086,839 | 1,086,839 | - |
| (iv) | වෙනත් ආදායම් | 18,840,640 | 22,584,463 | 23,272,464 | 9,553,476 | 57,888,760 | 27,799,668 | 18,470,084 | 10,585,983 |
| | **එකතුව** | **28,158,660** | **31,656,227** | **30,584,566** | **14,446,185** | **66,786,430** | **36,760,185** | **26,415,084** | **15,524,960** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 31.7ක් වූ අතර, වර්ෂය තුලදී රැස්කළ ආදායම රුපියල් මිලියන 30.5ක් විය. කෙසේ නමුත් වර්ෂය අවසානවන විටත් රුපියල් මිලියන 14.4ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 7කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

(අ) වරිපනම් බදු අය කිරීමට අදාල දේපළ වසර 5කට වරක් තක්සේරු කළ යුතු වුවත් සභාව විසින් 2006 වර්ෂයෙන් පසු වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුකර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයන්ට අදාල හිඟ වරිපනම් බදු රු. රු.2,944,405ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානවන විට එම හිඟ බදුවලින් රු. 1,014,881ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව හිඟ බදු අයකර ගැනීම සියයට 34ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ජල ගාස්තු රු.561,663ක් වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

### 2.2.4 කුලී

(අ) සභාව සතු දේපළ 04ක් බදුදීම සඳහා මිල ගණන් කැඳවා තිබුණද, බදුකරුවන් ඉදිරිපත් නොවීම නිසා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බදුදීමට නොහැකිවී තිබුණි.

(ආ) සභාව සතු කඩකාමර බදුදීමෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රු.173,060ක් අයවීමට තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

(අ) අංක 1995 දරන 2016 නොවැම්බර් 25 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව සහා බලප්‍රදේශය තුල ස්ථාපිත ස්ථානවල වාහන ගාල්කිරීම හා නවතා තැබීම සඳහා ගාස්තු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එම ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.2,733,514ක් වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,869,713ක් හා මුද්දර ගාස්තු රු.1,168,598ක් විය.

**2.3 අධිභාර**

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මව්සින් ඉකුත් වර්ෂයන් තුල පැනවූ අධිභාර වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.733,241ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 11ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) **ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගැනීමට කටයුතුකර නොතිබුණි.

**(ඈ) <u>පාරිසරික ගැටළු</u>**

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 දරන 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 64 (1) නියෝගය ප්‍රකාර සභාව විසින් අනුමතකර තිබුණු අංක 2816 දරන 2001 ජුනි 10 දිනැති පිඹුර අනුව තිබිය යුතු ඉඩමේ ඇල මාර්ගය දැක්වෙන කොටස සඳහා රක්ෂිතයක් අනුබෙදුමේ නොතිබුණි. තවද පිඹුර අනුව ඇල රක්ෂිතය සඳහා වෙන්කර තිබුණු මීටර 05ක පමණ රක්ෂිත ප්‍රදේශයේ ඇලමායිම දිගේ ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(ii) සභාව විසින් 2016 වර්ෂයේදී ගොඩනැගිලි සැලසුම අනුමතකර තිබුණු ඉඩමක පිඹුරෙහි නැගෙනහිර දෙසින් දැක්වෙන ඇල වර්ගඅඩි 252ක් ගොඩකර තිබුණු අතර මේ සම්බන්ධයෙන් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 28 වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(iii) සභාව විසින් 2015 වර්ෂයේදී අනුමතකර තිබුණු වාණිජ කාර්යයක් සඳහා වන ගොඩනැගිලි සැලසුමක, මාර්ග රක්ෂිතය සඳහා ප්‍රධාන මාර්ගයේ සිට අඩි 50ක දුරක් වෙන්කර ඇති බව දක්වා තිබුණද මාර්ග රක්ෂිතය සඳහා වෙන්කර තිබුණේ අඩි 39ක දුරක් පමණි.

**(ඉ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 25 දින වනවිටත් සකස්කර නොතිබුණි.

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) සභාව විසින් 2014 - 2017 කාල පරිච්ඡේදය තුලදී අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් හා අනුබෙදුම්පත් 59ක් සඳහා 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8(ඒ)(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත්කර නොතිබුණි.

(ආ) සභාව විසින් 2014 - 2016 කාල පරිච්ඡේදය තුලදී අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 26ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණි. තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 දරන 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුකූලතා සහතික ලබා නොගත් ඉදිකිරීම්වලින් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සහා බලප්‍රදේශයේ සිදුකර තිබුණු අනවසර ඉදිකිරීම් 14ක් සඳහා ආවරණ අනුමැතිය ලබාදීම හෝ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 28වන වගන්තිය ප්‍රකාර නීතිමය කටයුතු කිරීම හෝ සිදුකර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.249,876ක සේවක ණය සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අයකරගෙන නොතිබුණි.

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 හා 143(i) වගන්ති ප්‍රකාරව වාර්ෂික වටිනාකම් කෙරෙහි බලපාන පරිදි දේපළවලට කරන ලද වෙනස්කිරීම් මත නව තක්සේරු සිදුකර වරිපනම් බදු අයකර නොතිබුණි.

### 3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

2016 හා 2017 වර්ෂවලදී බදුදී තිබුණු බුත්තල සති පොළට අදාල රු.140,362ක ජලගාස්තු සභා අරමුදලින් ගෙවා තිබුණි.

### 3.6 වත්කම් කළමනාකරණය

#### 3.6.1 පවරා නොගත් වත්කම්

රාජ්‍ය ආයතනවලින් ප්‍රාදේශීය සභාවට ලැබුණු වාහන 03ක සහ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

#### 3.6.2 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

2003 වර්ෂයේදී හා 2012 වර්ෂයේදී රාජ්‍ය ආයතන 02කින් සභාවට ලැබුණු කුඩා ට්‍රැක්ටරයක් හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් වර්ෂ කිහිපයක සිට කිසිදු කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි.

### 3.7 ආර්ථික නොවූ ගනුදෙනු

2017 ජූලි මස සිට ක්‍රියාවිරහිතවී තිබුණු සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා නොකර සභාව විසින් ක්‍රියාත්මක කළ කර්මාන්තයකට පෞද්ගලික ආයතනයකින් බැකෝලෝඩර් යන්ත්‍රයක් යොදාගෙන ඒ සඳහා රු.192,500ක් ගෙවා තිබුණි.

### 3.8 හඳුනාගත් අලාභ

(අ) සභාවේ සේවය කළ අනියම් සේවකයන්ගේ 2012 ඔක්තෝබර් මාසයේ සිට 2015 ඔක්තෝබර් දක්වා කාලයට අදාල සේවක අර්ථ සාධක අරමුදල් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා රු.57,814ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ආ) සභාව සතු වාහන 10ක ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා නොගැනීම නිසා 2015 - 2018 දක්වා කාල පරිච්ඡේදයට අදාලව රු.20,335ක දඩ මුදල් ගෙවා තිබුණි.

**3.9** **<u>ප්‍රසම්පාදන</u>**

**3.9.1** **<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැයපාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ගිණුම්ගතකර තිබුණු ඉඩම් විධිමත් පරිදි තක්සේරු නොකිරීම |
| | (ii) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම |
| | (iii) උපචිත වියදම් ගිණුම්ගත නොකිරීම |
| | (iv) ලැබිය යුතු ආදායම් ගිණුම්ගත නොකිරීම |
| (ආ) වත්කම් | (i) ලේඛනගත නොකිරීම |
| | (ii) ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |